# අපේ අප්පච්චිගේ ගම



තරුෂි විහංසා තෙන්නකෝන්.

මහමායා බාලිකා විද්‍යාලය

# අපේ අප්පච්චිගේ ගම

තරුෂි විහංසා තෙන්නකෝන්.

කතෘගේ නම

**තවත් පොත්**

දහකාර හා පැංචා **2023**

මහාමායා බාලිකා විද්‍යාලය

**6** C පංතිය

ISBN 978-624-208-526-5

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ජෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනිමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිම්පාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **“හෙරණගත්කරණී”** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දිමට ලැබිම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

ඉස්කොලේ නිවාඩු කාලේ ඇවිල්ලා..... මේ නිවාඩුවට අපි අප්පච්චිගේ ගමට යනවා........ ටික දවසක් ඉදලා එන්න අම්මා අයියටයි මටයි කිව්වා...... එක අහපු අපි දෙන්නට ඇති වුනේ කියන්න බැරි සතුටක්...

ඒ දවස අද... අපි සියලු දෙනා උදේන්ම අප්පච්චිගේ ගමට යන්න පිටත් වුනා.... අපි පැය දෙක තුනක් ගෙවා දමා සුන්දර ගම්මානේට පැමිනියා .....



රබර් ගස් යායක් මැදින් වැටි ඇති කුඩා පාරක් මැදින් ගම්මානයට ඇතුලු වුනා... ගමට ඇතුලු වෙන තැන සිට දසතම කොල පාටින් පෙනේන කුඹුරු යාය... ඒ මැදින් වැටි ඇති පාර දිගේ අපි අප්පච්චිගේ මහ ගෙදරට පැමිනියා ගෙදර තියෙන්නේ තරමක් උස් ස්ථානයක නිසා වටේට තියෙන කුඹුරු යාය ලස්සනට පෙනවා.... කුඹුරු යායට ඉහලින් රබර් වතු දකිද්දි හිතට සහ ගතට ඇති කලේ මහත් සුවයක බවක්. එදා නිවසේ රැදි සිටි අපි පසු දා ගම වටේ ඇවිදින් නැදැයින් බලන්න යන්න තිරණය කලා....

පසු දා උදා වුනා .... දුවේ අපි යමු රබර් වත්ත බලන්න අප්පච්චි උදෙන්ම යෝජනා කලා .... මම අප්පච්චිගේ අතේ එල්ලිලා ගියා.... රබර් වත්ත තියෙන්නේ කන්දක අපි රබර් ගස් අතරින් කන්ද නැග්ගා අවට හරිම ලස්සනයි..



නැන්දලා කිහිප දෙනෙක් රබර් කිරි එකතු කරවා .... කොහොම ද නැන්දේ මේ කිරි ගන්නේ මම සෝමා නැන්දගෙන් ඇහුවා පුතේ අපි උදේන්ම ඇවිත් ගස් වලට කැපුමක් දමනවා ඒ කැපුම නිසා රබර් ගස් වල තියෙන කිරි එලියට එනවා.... කිරි එකතු වෙන්න මේ පොල් කටු තියෙල තියනවා.... කැපුම දාල පැය තුන හතරක් යද්දි පොල් කට්ට පිරෙන්න කිරි එකතු වෙනවා .... අපි ඒ කිරි තමයි මේ එකතු කරන්නේ... ගසේ කැපුප උඩ ඉදල පහලට දමා තියෙනවා හරියට කානුවක් වගේ ඉහල ඉදලා පහලට කිරි ගලා ගෙන ඇවිත් පොල් කටු වලට වැටෙනවා .... නැන්දලා පොල් කටු වල කිරි එකතු කරලා නැවත ඒ තැනම තියෙනවා....





ඇයි නැන්දේ කිරි එකතු කර ගත්තාට පස්සේත් පොල් කටුව ගහේ ම තියන්නේ පුතේ අපි කිරි එකතු කලාට තව කිරි ටික ටික එකතු වෙනවා ඒවා අපි පසුව එකතු කර ගන්නවා ඒ වා එකතු කර ගන්න කොට ඝන වෙලා තියෙන්නේ ඒවාට කියන්නේ ඔට්ටපාල කියලා .... සෝමා නැද්දත් එක්ක කතා කර කර ඉදැද්දි  මැණිකේ නැන්දා එතනට ආවා ලොකු බුලියකුත් අර ගෙන අද කිරි ගොඩක් එකතු වෙලා වගේ අප්පච්චි කිව්වා.. ඔව් මේ දවස් වල කිරි ටිකක් තියෙනවා වැහි කිපයක් ම වැටුනානේ .....

පසු ගිය ඉඩෝරේ කාලේ කිරි තිබුනේ ම නැහැ.... පෙබරවාරි මාසේ ගස්වල කොල වැටෙනවාත් එක්කම ඉඩෝරේ ඇල්ලුවා ගස්වල කොල වැටෙන කාලෙත් කිරි ඇත්තේ ම නැහැ... කොල වැටෙන කාලේ තමයි ගස් වලට පොහොර දාන්නේ මේ සැරේ හරියට ම පොහොර දාන්න පුලුවන් වුනා.... මැණිකේ නැන්දා කියා ගෙන කියා ගෙන යනවා....



මැණිකේ ඔයා රබර් පිහිය දලා යන්නේ ... දුවේ ඇවිත් මේ පිහිය මැණිකේ නැන්දට දෙන්න.... සෝමා නැන්දා කෑ ගහනවා .... නැන්දේ පිහියක් කිව්වට මේක හරිම වෙනස් නේ.... ඔව් පුතේ එක රබර් ගසේ කැපුම දාන්න පහසු වෙන ආකරයට තමයි හදලා තියෙන්නේ.... .අපි නැන්දලා පිටු පසින් ම කන්ද බැහැගෙන ගෙදරට ආවා... කිරි එකතු කර ගෙන ආව නැන්දලා ඒ පාර සූදානම් වෙන්නේ කිරි මිදෙන්න දාන්න.....නැන්දලා කිරි පෙරලා ලොකු බාදියක ට දාලා එකට වතුර දානවා.... දැන් කිරි කුඩා තැටි වලට වක් කරනවා ඊට පස්සේ ඒවාට ඇසිට් වගයක් දානවා දල කලවම් කරලා මිදෙන්න තියෙනවා....



නැන්දේ මේ තැටිවල තියෙන කිරි මිදෙන්න කොච්චර වෙලාවක් යයිද.. පුතේ පැය තුන හතරක් යනවා .....තැටිවල තියෙන කිරි මිදුනා අපි ගිහින් මේ තැටි වල තියෙන කිරි කුට්ටි රෝලකට දාල තලලා වතුර ඉවත් කරනවා.... නැන්දා කිරි රෝලට අරන් යද්දි මටත් කථා කරන්න...



නැන්දා වැඩ ඉවරයි නේද දැන් අපි යමු තේ බොන්න .... අපේ අම්මා නැන්දලාට තේ හදලා තියෙනවා...

අපි තේ බොන්න යද්දි අම්මා ලැවරිය පිගානක් මේසය උඩ තිබ්බා .... අනේ මගේ ආසම කැම කවුද හැදුවේ.. මම තමයි.....සිනා සෙමින් ගේ ඇතුලේ ඉදලා සේනේ ලොකු අම්මා ආවා.... එයා ලැවරිය ගොඩකුත් හදාගෙන අපිව බලන්න ඇවිත්.... අනේ ලොකු අම්මා බොහෝම ස්තූතියි... මගේ ආසම කැම.. අපි සියලු දෙනා ම එකතු වෙලා තේ බිවා....

පුතේ මේ කවු ද ඇවිත් ඉන්නේ බලන්න .... අම්මා කථා කරනවා ඇහුනා... මගේ ගමේ යාලුවෝ ඇවිල්ලා අපි එකතු වෙලා සෙල්ලම් කලා හැංගි මුත්තන් සෙල්ලම් කලා...බට්ටා

පැන්නා.... අල්ලම් සෙල්ලම් කලා.... හරිම මහන්සියි දවල් දෙකට විතර ගෙදර ඇවිල්ලා නාල දවල්ට කෑවා... කලා අපි කට්ටියම ගෙදර ඉස්සර ඉස්තෝප්පුවට වෙලා කථා කර කර හිටියා....

සවස තුන හමාරට විතර සෝමා නැන්දා ආවා.. රබර් කිරි කුට්ටි රෝලට ගෙනි යන්න.. අම්මා මමත් සෝමා නැන්දා එක්ක රෝලට යනවා... මම අම්මාට කියන ගමන්ම සෝමා නැන්දා ලගට දුව ගෙන ගියා.. සෝමා නැන්දා තැටිවල දාපු කිරි කැලි අතින් තද කරලා වතුර බෙරලා යවනවා.. එවා සියල්ල එකතු කරලා රෝලට ගෙනියන්න ලැහැස්තියි... මම සෝමා නැන්දා පිටිපස්සේම රෝලට ගියා...





සෝමා නැන්දා කිරි කුට්ටි රෝලේ තියලා රෝල කරකවනවා එතකොට රබර් කුට්ටි වල තියෙන වතුර බෙරිලා රබර් සිට් එකක් හැදෙනවා..



ඒ රබර් ශීට් ගෙදර ගෙනල්ලා දුමට දාල දුම් ගහනවා දුම් ගහලා කලු පාට උනාම දුමෙන් අයින් කරලා විකුණනවා..



එදා හවස පහට විතර අපි පන්සලට ගියා පන්සල් යන්න වතු සුද්ද මල් වට්ටියක් උඩහ ගෙදර නන්දා නැන්දා කඩා ගෙන ඇවිත් දුන්නා...අපි බුදුන් වැඳලා පන්සලේ ලොකු හාමුදුරුවෝ ලගට ගියා.. අපි කාලෙකින් ගමට ගියේ පන්සල ලස්සනට හදලා විවිධ ගස් වර්ග හිටවලා

දැන් පන්සල හරිම ලස්සනයි.. අපි ලොකු හාමුදුරුවන්ට කිව්වා.. ලොකු හාමුදුරුවෝ අපිට පිරිත් කියලා පිරිත් නූල් බැන්දා අපි ලොකු හාමුදුරුවන්ට වැඳලා අතරම සතුටින් ගෙදර ආවා.. හිතට පුදුම සැනසිල්ලක් දැනෙනවා අම්මායි කිව්වා..



ගෙදර ඇවිත් පොතක් බැලුවා... අම්මේ අපි රෑට මොනව ද කන්නේ.... පුතේ මම මොනවා වත් හැදුවේ නැහැ නන්දා නැන්දලාගේ ගෙදරින් රෑට කෑම ගෙනවා කිව්වා.. අපි කාලෙකින් ගමේ ආව නිසා නන්දා නැන්දා අපිට කෑම හදලා... සවස හත විතර වෙනකොට නන්දා නැන්දා යි සුදු අක්කියි කෑම අරන් ආව.. කෑම හරිම සුවදයි...ඉදිආප්ප හදාලා අල කිරි හෙදි... උම්බලකඩ සම්බෝල හරිම රසයි වගේ... නන්දා නැන්දයි අම්මයි අප්පච්චියි තොරතුරු කථා කරනවා.. අපිට නිතරම ගමට එන්න කියනවා අපි නැති වුනහම ඒ අයට පාලුයි ලු.....

පසුව දා මට දවල් වෙනකම් ම නින්ද ගියා අම්මා මට කථා කරලා නැහැ නිදහසේ ගමේ ඉන්න ආව නිසා ටිකක් නිදා ගන්නට කමක් නැතිලු.... ගමට ආවට පස්සේ අම්මා වෙනස් වෙලා මම හිනා වෙලා කිව්වා..

එදා මම ගියේ අපේ වත්තට වත්තේ පරණ රබර් ගලවලා අලුතේන් හදන් හදනවා.. වලවල් සකස් කරලා අඩි දෙකක් විතර ගැඹුරුයි... අඩි දෙකක් විතර පලලයි.. වලවල් දෙකක් අතර අඩි 8 විතර ඉඩක් තියෙනවා. ඇයි අප්පච්චි මේ විදිහට...... පුතේ රබර් ගස් ලොකු වෙන්න අවුරුදු 5 ක් 6ක් යනවා ඒ ගස් ලොකු වෙනකම් හොදින වැවෙන්න තමයි මේ විදිහට කරන්නේ අප්පච්චි කිව්වා.. මාම කෙනෙක් වලවල් වලට කුකුල් පොහොර දානවා ඇයි අප්පච්චි කුකුල් පොරොර පුතා පැල හැදූවාහම වලවල් වල තෙතමනය හොදින් නැති වුනොත් පැල මැරෙනවා.. කුකුල් පොහොර දාල පිදුරු දාල තියෙනවා එතකොට වලවල් වල තෙතමනය රැදෙනවා එතකොට පැල හැදූවටා පස්සේ හොදින් පැල වෙනවා ..







අප්පච්චි ගස් අතර මෙච්චර ඉඩක් තිබුන එක අපරාදේ නේද .. නැහැ පුතා ගස් ලොකු වෙනකම් ඒ අතර තියෙන ඉඩ ප්‍රයෝජනයට අරන් කෙසෙල් ,පැපොල් වගේ තාවකාලික වගාවන් කරන්න පුලුවන් රබර් පැල ලොකු වෙනකම් එයින් හොද

ආදායමක් ගන්නත් පුලුවන්.. අප්පච්චි දන්න දෙවල් මට කියවුනා..



මම අප්පච්චි එක්ක දවල් එකට පමන වැඩ ඉවර කරලා ගෙදර ආවා... අපි එන පාරේ නවරත්න මාමාගේ වත්ත තියෙන්නේ.. අපි වත්තටත් ගියා ඒයා වත්ත සුද්ද කරලා සාදික්කා වවලා... සාදික්කා ගස් හැදුනහම හරිම ලස්සනයි.. මාමේ මේ ගස් අතර මොනවා ද මේ වවල තියෙන පදුරු වගේ ගස්...... පුතේ ඒ එනසහල් එනසහල් හරි ගනන් මම වත්තේ එනසහල් හදන්න තමයි අදහස් කර ගෙන ඉන්නේ.. ඒයා ගේ වත්ත වටේට එයා පුවක් පැල හිටවලා පුවක් ගස් නිසා වත්ත වටේට වැටක් හැදුවා වගේ තියෙනවා පුවක් ගස් වැට නිසා උරෝ වගේ සතුන්ට ත් එන්න බැහැ.. හරිම පිලිවලට කරලා තියෙන වගාවක්..

අපි දවල් වෙද්දි අපි ගෙදර ආවා අම්මා දවල් කෑම හදලා මෑකරල් කොල මලවලා අඹ තෙල් දාල ඒ වා ගෙනත් දිල තියෙන්නේ විජේ මාමා කිරි කොස් මාලුවක් උයලා කොස් ගෙනත් දිල තියෙන්නේ සේනේ ලොකු අප්පච්චි ගමේ තියෙන්නේ පුදුම සහයෝගයක් ඒ ගැන හරි ම සතුටුයි .

අපි දවල් ට කාලා ගමේ නැදැයින් බලන්න ගියා ඒ යද්දි ඒයා ලා ගේ ගෙවල් වලින් නොයෙක් වර්ගයේ රස කැවිලි කාලා තේ බිව්වා . යාලුවෝ එක්ක සෙල්ලම් කලා.....හරිම සතුටුයි.....

.

පුතේ අපි හෙට නැවත ගෙදර යනවා අම්මා එදා රෑ කිව්වා හිතට ඇති වුනේ . .හරිම දුකක් . හෙට දවස හිමින් උදා වෙන්න කියලා හිතා ගෙන රෑ නින්දට ගියා.



## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණාකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි  බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශිය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා  වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ  ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ  එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදී ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ  ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත්  සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන්  වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන්  ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්